## පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය: 95

## ආයතනයේ නම : බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ

ගරු. ආයතනය භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

## பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்க: 95

## நிறுவனத்தின் பெயர்: புத்தசாசனம், மத மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் நிறுவனங்களிற்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

## Parliament Series No: 95

## Name of the Institution: Ministry of Buddhasasana, Religious and Cultural Affairs

Submission of observations of Hon. Minister in charge of the institutions and steps taken with regards to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවට අදාළව

ආයතන වෙනස් කිරීමේදී අමාත්‍යවරයා විසින් ගනු ලැබූ නිරීක්ෂණ සහ ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට අදාළව - පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 95

| අනු අංකය | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | කාරක සභාවේ නිරීක්ෂණ / නිර්දේශ / නියෝග | නිර්දේශ / නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය |
|---|---|---|---|
| 01. | කාලීන අවශ්‍යතා මත පුරාවිද්‍යා ජාතික ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම | ජනාධිපතිතුමාට ඉදිරිපත් කිරීමට නියමිත පුරාවිද්‍යා ජාතික ප්‍රතිපත්තිය සංශෝධනය කිරීමට අදාළ කාරණා සම්බන්ධයෙන්ජාතික ප්‍රතිපත්තියෙහි සඳහන් ආයතන කැඳවා ඔවුන්ගේ අදහස් සහ යෝජනා ද ලබාගෙන ඒ අනුව කටයුතු කරන ලෙස පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වෙත කාරක සභාව විසින් නියෝග කරන ලදි.<br><br>**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් 2023.09.25 දිනැති, අංක MBRCA/13/26/2023 දරන ලිපිය මඟින් උක්ත කරුණු පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.** | පුරාවිද්‍යා ජාතික ප්‍රතිපත්තිය සංශෝධනය කිරීමට අදාළව බුද්ධ ශාසන අමාත්‍යාංශය විසින් විද්වත් කමිටුවක් පත්කර ඇත. එම කමිටුව සඳහා දෙපාර්තමේන්තු මට්ටමින් කාර්යය නිර්ණය අනුදේශ (Term of References [TOR]) ලබා දීමට නියමිතය. |

| | | | |
|---|---|---|---|
| 02. | කිමිදුම්කරුවන් සඳහා ජීවිත රක්ෂණයක් ලබා ගැනීම | කිමිදුම්කරුවන් සඳහා ජීවිත රක්ෂණයක් ලබා ගැනීමට අදාළ කටයුතු කඩිනම් කිරීමට මැදිහත්වන ලෙස බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත කාරක සභාව විසින් නියෝග කරන ලදි.<br><br>**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් 2023.09.25 දිනැති, අංක MBRCA/13/26/2023 දරන ලිපිය මඟින් උක්ත කරුණු පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.** | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මුහුදු පුරාවිද්‍යා ඒකකය සහ මධ්‍යම සංස්කෘතික අරමුදලේ මුහුදු පුරාවිද්‍යා ඒකකය මේ සම්බන්ධව සාකච්ඡා කර, ජීවිත රක්ෂණයක් ලබා ගැනීමට අදාළ ආයතනයක් තේරීමේ කටයුතු සිදු කර ඇත.ඒ අනුව එක් ආයතනයක් කැමැත්ත ප්‍රකාශ කර ඇත.<br><br>මේ සම්බන්ධව ප්‍රසම්පාදන කටයුතු මධ්‍යම සංස්කෘතික අරමුදලේ අරමුදලේ මුහුදු පුරාවිද්‍යා ඒකකය මඟින් සිදු කරමින් පවතී. ඒ අනුව එම රක්ෂණාවරණය නිවැරදිව යොදාගැනීමට හැකිවීම මත එය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ද යොදා ගැනීමට තීරණය කර ඇත. ආයතන දෙකේ ම මුහුදු පුරාවිද්‍යා ඒකක දෙකේ නිලධාරීන් එක්ව සාකච්ඡා කරමින්, මෙම වැඩකටයුතු සිදු කරගෙන යන බව වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි. |
| 03. | වෙරළ සහ සාගරය සම්බන්ධ ආයතනවල ඒකාබද්ධතාවය වර්ධනය කිරීම | වෙරළ සහ සාගරය සම්බන්ධයෙන් කටයුතු කරන ආයතනවල ඒකාබද්ධතාවය ඇති කිරීම සඳහා නෛතික ප්‍රතිපත්ති සම්පාදනය කර අවශ්‍ය කමිටු/ සුදුසු ක්‍රමවේද සකසන ලෙස බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත කාරක සභාව විසින් නියෝග කරන ලදි. | ශ්‍රී ලංකා මුහුද සහ වෙරළ ප්‍රදේශය සමඟ ඍජුව ම කටයුතු කරන ආයතන ශ්‍රී ලංකා නාවික හමුදාව සහ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ධීවර හා ජලජ සම්පත් ආයතනය බැවින් එම ආයතන විසින් මෙවැනි කටයුතු කළ යුතු අතර එය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් වන කටයුත්තක් නොවන බව කාරුණිකව දන්වා සිටිමි. මීට පෙර ද ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය මඟින් අන්තර් අමාත්‍යාංශ කමිටුවක් පත්කර ක්‍රියාත්මක කළ බව දන්වා සිටිමි. එම කමිටුවේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදි. |

| | | | |
|---|---|---|---|
| 04. | ජලජ (සාගර) පුරාවස්තු ගැසට් නිර්දේශ / නියෝග කිරීම | දැනට හඳුනාගෙන ඇති සාගර පුරාවස්තු 113, 2023 දෙසැම්බර් මස 01 වැනි දිනට පෙර ගැසට් කිරීමට කටයුතු කරන ලෙසත්, 2023 ජුලි මස 28 වනවිට එම ගැසට් කිරීමට අදාළ ක්‍රියාකාරී සැලැස්ම (Action Plan) අඩංගු වාර්තාවක් කාරක සභාව වෙත ලබා දෙන ලෙසත්, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත කාරක සභාව විසින් නියෝග කරන ලදි.<br><br>**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් 2023.09.25 දිනැති, අංක MBRCA/13/26/2023 දරන ලිපිය මඟින් උක්ත කරුණු පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.** | පුරාවස්තු ආඥා පනතින් හා අන්තර්ජාතික නීති හා බලතල යටතේ මෙම පුරාවස්තු ආරක්ෂා වී ඇත. දේශීය හා ජාත්‍යන්තර අණ පනත් සියල්ලෙන්ම නීතිමය පදනමක් යටතේ සාගර පුරාවස්තු ආරක්ෂා වී ඇත. සාගර පත්ලේ පවතින පුරාවස්තු නිරන්තරයෙන් විතැන්වීම්වලට ලක්වන බැවින් ගැසට් කිරීම ප්‍රායෝගිකව ගැටළුසහගතය. |
| 05. | සාගර පුරාවිද්‍යා ස්ථාන ආශ්‍රිත සංචාරක කිමිදුම් සේවා ආරම්භ කිරීම | ලංකාව වටා ඇති සාගර පුරාවිද්‍යා ස්ථාන ආශ්‍රිත කිමිදුම් කටයුතු සඳහා සේවා සපයාගත හැකි ස්ථාන නම් කිරීමටත්, එම ස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනයට සහ සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමට වැඩපිළිවෙළක් සකසන ලෙසත් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා වෙත කාරක සභාව විසින් නියෝග කළේය. | මේවනවිට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහ මධ්‍යම සංස්කෘතික අරමුදලේ මුහුදු පුරාවිද්‍යා ඒකක දෙකේම නිලධාරීන් විසින් මේ සම්බන්ධව සාකච්ඡා වට කිහිපයක් පවත්වා ඇත. සංචාරකයන් හට කිමිදුම් කටයුතු සිදුකළ හැකි ස්ථාන තෝරා ගැනීමේ දී ඔවුන්ගේ ජීවිතාරක්ෂාව පිළිබඳ දැඩි සැළකිල්ලක් දැක්විය යුතුය.එබැවින් දැනට ඇති මුහුදු පුරාවිද්‍යා ස්ථාන වලින් විශේෂ ස්ථාන තෝරාගැනීමක් සිදු කරන අතර ඉන්පසුව එම ස්ථානවල යටිතල පහසුකම් වර්ධනය කළ යුතුය. එබැවින් 2025 වර්ෂයේ සිට අදාළ කටයුතු ආරම්භ කිරීම සඳහා ආයතන දෙකේම නිලධාරීන් අදාළ මූලික වැඩ කටයුතු ආරම්භ කර ඉදිරියට සිදු කරගෙන යනු ලබයි. |

| | | | |
|---|---|---|---|
| 06. | රාජ්‍ය සේවයේ සිටින පුරාවිද්‍යා උපාධිධාරීන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අනුයුක්ත කිරීම | අමාත්‍ය මණ්ඩලයෙන් අදාළ ප්‍රතිපත්ති අනුමත කර ගැනීම සහ බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීම සම්බන්ධයෙන් වන වාර්තාවක් 2023 ජූලි මස 28 වනවිට කාරක සභාව වෙත ලබාදෙන ලෙස බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා වෙත කාරක සභාව විසින් නියෝග කරන ලදී.<br>බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් 2023.09.25 දිනැති, අංක MBRCA/13/26/2023 දරන ලිපිය මඟින් උක්ත කරුණු පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. | පුරාවිද්‍යා පර්යේෂණ නිලධාරී තනතුරු ස්ථාපනය කර, උපාධිධාරීන් රඳවා තබා ගැනීම සඳහා සාකච්ඡා අවස්ථාවක් ලබා දෙන ලෙස ඉල්ලා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශය වෙත 2024.09.18 දිනැතිව ඉල්ලීම් ලිපියක් යොමු කර ඇති අතර එය 2024.09.30 දිනැතිව බුද්ධ ශාසන අමාත්‍යාංශය විසින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. |
| 07. | පුරාවිද්‍යා උපදේශන සභාව හා අනෙකුත් පුරාවිද්‍යාව හා සම්බන්ධ වූ ආයතනවල පිහිටුවා ඇති අදාළ සභා / කමිටු සමඟ නිසි සම්බන්ධීකරණයක් ඇති කර ගනිමින් එම ආයතන සතු පුරාවිද්‍යාත්මක දත්ත, තොරතුරු හා අදාළ අනෙකුත් කරුණු ඒකරාශී | අදාළ විෂයභාර අමාත්‍යවරයා සමඟ ද සාකච්ඡා කොට වර්තමානයේ පුරාවිද්‍යාව හා සම්බන්ධ ආයතනවල පිහිටුවා ඇති සභාවන් / කමිටු ඒකාබද්ධ යාන්ත්‍රණයක් තුළට ගැනීමට ක්‍රමවේදයක් සකසා,<br>• එම සකසන ක්‍රමවේදය සහ<br>• එම සභා/ කමිටුවල සංයුතිය, ඒවායේ කාර්යභාරය, දැනට පත්ව සිටින සාමාජිකයන්සහ ඔවුන් පත් වූ දිනයන්, ඒවායේ කැඳවුම්කරුවන් කවුරුන්ද, යන කරුණු ඇතුළත් සම්පූර්ණ වාර්තාවක් මාසයක් ඇතුළත ලබාදෙන ලෙස කාරක සභාව විසින් බුද්ධශාසන, | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වැනි පුරාවිද්‍යාව හා සම්බන්ධ ආයතනයන්හි මේවනවිට සභා / කමිටු ක්‍රියාත්මක වේ. මේවා ආයතන ප්‍රධානියා විසින් සිය කාර්ය කිරීම සම්බන්ධයෙන් උපදෙස් අපේක්ෂා කළ විටෙක, උපදෙස් ලබා දී ම සඳහා පිහිටුවන ලද උපදේශක සභා/ කමිටු වේ. එම සභා /කමිටු ඒකාබද්ධ යාන්ත්‍රණයක් තුළට ගෙන, පුරාවිද්‍යා දත්ත, තොරතුරු සම්බන්ධව ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් මේවනවිට අමාත්‍යාංශය සමඟ අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලබයි. |

| | | | |
|---|---|---|---|
| | කොට ගෙන ඒ සම්බන්ධව ක්‍රියාත්මක වීමට යාන්ත්‍රණයක් ගොඩනැඟීම | ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා වෙත කාරක සභාව විසින් නියෝග කරන ලදි.<br><br>**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් 202309.25 දිනැති, අංක MBRCA/13/26/2023 දරන ලිපිය මඟින් උක්ත කරුණු පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.** | |
| 08. | නිර්දේශිත ලෝක උරුමයන් පිළිබඳ වාර්තාවක් ලබා ගැනීම | ලෝක උරුමයන් ලෙස නම් කිරීමට යුනෙස්කෝ ආයතනයට යෝජනා කිරීමට තීරණය කරන ලද ස්ථාන හා එම කෙටුම්පත ලබා දීමට කටයුතු කරන දින වකවානු, දළ සැලැස්මක් ඇතුළත් වාර්තාවක් 2023 ජූලි මස 28 දිනට පෙර කාරක සභාව වෙත ලබාදෙන ලෙස පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වෙත කාරක සභාව විසින් නියෝග කරන ලදි.<br><br>**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් 202309.25 දිනැති, අංක MBRCA/13/26/2023 දරන ලිපිය මඟින් උක්ත කරුණු පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.** | **මේවනවිට අරන්කැලේ, නාගොල්ල, රිටිගල හා මානාකන්ද යන පුරාවිද්‍යා ස්ථාන පොරොත්තු ලේඛනයේ අන්තර්ගතව ඇත. ඉදිරි කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.** |

| | | | |
|---|---|---|---|
| 09. | රට තුළ තිබෙන පුරාවිද්‍යා ස්ථාන සිතියම්ගත කිරීම සහ ඒවා වෙබ් අඩවියට ඇතුළත් කිරීම | විෂයභාර අමාත්‍යවරයාගේ ද අදාළ අනෙකුත් පාර්ශවවල ද උපදෙස් ලබාගෙන රට තුළ තිබෙන සියළු පුරාවිද්‍යා ස්ථාන සිතියම්ගත කිරීම සහ ඒවා වෙබ් අඩවියට ඇතුළත් කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් ඇතුළත් වාර්තාවක් 2023 අගෝස්තු 25 දින වනවිට කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වෙත කාරක සභාව විසින් නියෝග කරන ලදි.<br>**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් 202309.25 දිනැති, අංක MBRCA/13/26/2023 දරන ලිපිය මගින් උක්ත කරුණු පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.** | එක් මසක් තුළ දී නව පුරා ස්ථාන 100 ක් යාවත්කාලීන කිරීමේ වැඩපිළිවෙළක් මේ වනවිට ආරම්භ කර ඇති අතර ස්ථාන 2056 ක අගයක් වෙබ් මේවනවිට අඩවියට ඇතුළත් කර ඇත. මේ සඳහා නව ක්‍රියාකාරී සැලැස්මක් (Action Plan) සකස් කරමින් සිටින අතර කඩිනමින් ඔබ වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| 10. | පුරාවිද්‍යා කැණීම් කටයුතු මෙහෙයවීම / අධීක්ෂණය කිරීම හා සංරක්ෂණය | රට තුළ සිදුකරන පුරාවිද්‍යා කැණීම් කටයුතු මෙහෙයවීම / අධීක්ෂණය සඳහා ඒ සම්බන්ධ තොරතුරු දත්ත පද්ධතියකට ඇතුළත් කර තබා ගැනීමට කටයුතු කරන ලෙස බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා වෙත කාරක සභාව විසින් නියෝග කරන ලදි.<br>**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් 202309.25 දිනැති, අංක MBRCA/13/26/2023 දරන ලිපිය මගින් උක්ත කරුණු පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.** | දෙපාර්තමේන්තුව මගින් හා බලපත්‍ර යටතේ සිදුකරන කැණීම් සම්බන්ධ ලේඛන හා පරිගණක හා දත්ත ගොනු යාවත්කාලීන කරමින් පවත්වාගෙන යනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | සංරක්ෂණය නිරීක්ෂණය කිරීම | වැය කර ඇතත් එය මේවනවිට තවදුරටත් සංරක්ෂණය කිරීමට නොහැකි මට්ටමට විනාශ වී ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළේය.<br><br>අත්තනගල්ල පාරුව සංරක්ෂණ පියවර පිළිබඳව වාර්තාවක් 2023 ජූලි මස 28 වන දිනට පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙසබුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා වෙත කාරක සභාව විසින් නියෝග කරන ලදි.<br><br>බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් 202309.25 දිනැති, අංක **MBRCA/13/26/2023** දරන ලිපිය මඟින් උක්ත කරුණු පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. | සැලැස්ම ඇඳීමේ කටයුතුවල අවසන් අදියර මේවනවිට සිදු කරගෙන යනු ලැබේ. එය නිම වූ පසු රසායන සංරක්ෂණ කටයුතු ඇරඹීමට නියමිතය. |
| 12. | පුරාවිද්‍යා භාණ්ඩවල අනන්‍යතාවය තහවුරුකර ගැනීම සඳහා නවීන තාක්ෂණික උපකරණ භාවිතයට ගැනීම | පුරාවිද්‍යාත්මක භාණ්ඩවල අනන්‍යතාවය තහවුරු කර තබා ගැනීම සඳහා නවීන තාක්ෂණික උපකරණ භාවිතයට වහාම වැඩපිළිළෙක් සාදන ලෙසටපුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වෙත කාරක සභාව විසින් නියෝග කළේය.<br><br>බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු | කාබන් කාලනීර්ණය වැනි කටයුතු සඳහා තාක්ෂණික උපකරණ භාවිතා වන අතර, ඒවායේ සැපයුම් මිල මෙන්ම ඒවා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පිරිවැය සහ පුහුණු කාර්යය මණ්ඩලය ශ්‍රී ලංකාව වැනි රටකට දැරිය හැකි මට්ටමක නැත. එමෙන්ම එවැනි අවශ්‍යතා ඇතිවන්නේ කලාතුරකින් වන බැවින් ඒ සඳහා වගකීමක් ඇති විදේශීය ආයතනයක් මඟින් එම වාර්තා ලබා ගැනීම වඩාත් සුදුසුය.<br><br>කෙසේ නමුත් කෞතුකාගාර හා රසායනාගාර සතුව ඇති වංචල |

| | | | |
|---|---|---|---|
| | | අමාත්‍යාංශයේ ලේකම් විසින් 202309.25 දිනැති, අංක **MBRCA/13/26/2023** දරන ලිපිය මඟින් උක්ත කරුණු පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. | පුරාවස්තු ලේඛනගත කිරීම සඳහා විද්‍යුත් ක්‍රමාංක ක්‍රමයක් (තීරු හෝ QR කේත) සකස් කිරීම මඟින් ඒවායේ අනන්‍යතාව හඳුනාගත හැකි ආකාරයට ලේඛනගත කර පවත්වා ගත හැක. ඒ සඳහා එම තාක්ෂණය දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සැලසුම් කරමින් පවතී. |

..............................................................

ඒ.එම්.පී.එම්.බී. අතපත්තු
ලේකම්
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
අංක 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

ඒ.එම්.පී.එම්.බී. අතපත්තු,

ලේකම්,

බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

..............................................................

ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි (පා.ම.)
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
7 වන මහල, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය